සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## தென் மாகாணக் கல்வித் திணைக்களம்
## Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 13 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 13, Second Term Test, March 2020**

**තාක්ෂණවේදය සඳහා විද්‍යාව - I**
**Science for technology - I**

67 | S | I

*පැය දෙකයි.*
*Two hours*

විභාග අංකය:.....................................................................

**උපදෙස්:**
- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැළකිල්ලෙන් කියවා පිළිපදින්න.
- **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් ( × ) යොදා දක්වන්න.**

(1) පහත වගන්ති අතුරින් වැරදි වගන්තිය තෝරන්න.

A) යුක්තාණුව නිශ්චිත ප්‍රවේණික සංයුතියක් දරයි.

B) ජීවියාගේ වර්ධනය හා විකසනයේ දී එකිනෙකට වෙනස් කාර්යයන් සිදු කිරීමට සෛලයේ ව්‍යුහ විශේෂණය වේ.

C) මානව යුක්තාණුවක අඩංගු ප්‍රවේණික ද්‍රව්‍ය වලින් $\frac{3}{4}$ ක් ලබා දෙනුයේ පුරුෂයාගෙනි.

D) ජීවියකුගේ ලක්ෂණ ඊළඟ පරම්පරාවට ගමන් කරන්නේ ප්‍රවේණික ද්‍රව්‍ය මගිනි.

E) සෛල සංවිධානය වන ආකාරයට අනුව ප්‍රධාන සෛල වර්ග දෙකකි.

1) A  2) B  3) C  4) D  5) E

(2) කොම්පෝස්ට් පොහොර නිශ්පාදන ක්‍රියාවලියකදී වැඩි තෙතමනය ඉවත් වීමට පතුල සවිවර තැටියකින් සාදා ඇත්තේ පහත කවර ක්‍රමයේ දී ද?

1) ජීරක බඳුන් ක්‍රමය  2) ගොඩ ක්‍රමය  3) වල ක්‍රමය
4) ජීව කොටු ක්‍රමය  5) භ්‍රමණ බඳුන් ක්‍රමය

(3) ඇතුළතින් සෛලම ද පිටතින් ප්ලෝයම ද එම පටක දෙක අතර විභාජක සෛල ස්තරයක් ද පිහිටා ඇත්තේ ශාක කඳක,

1) අපිචර්මයේ ය.  2) බාහිකයේ ය.  3) සනාල කලාපයේ ය.
4) මජ්ජාවේහි ය.  5) පූරකයේ ය.

(4) මින් වැරදි වගන්තිය වනුයේ,

1) පටක රොපණය ආරම්භ කිරීම සඳහා යොදා ගන්නා පටක කොටස් පූර්වක ලෙස හඳුන්වයි.
2) රෝපණ මාධ්‍යයක දී පූර්වකයේ සෛල විභාජනය වී නැවත විභාජනය විය හැකි විභේදනය නොවූ සෛල ස්කන්ධයක් කිණකය ලෙස හඳුන්වයි.
3) පටක රෝපණයේ වාසියක් වන්නේ සෑම ශාක විශේෂයකට ම යොදා ගත හැකි වීමයි.
4) රෝපණ මාධ්‍යය පිළියෙල කර ජීවාණුහරනය සඳහා පීඩන උඳුන යොදා ගනියි.
5) පටක රෝපණයෙන් ලබා ගන්නා ශාක වලින් අස්වනු කෙටි කලකින් ලබාගත හැකියි.

(5) කුකුළාගේ ශරීර කොටසක් නොවන්නේ,

1) පොර කටුව  2) වලිගය  4) කෙණ්ඩය
4) ශල්කය  5) තැල්ල

(6) X නම් හයිඩ්‍රෝ කාබනික සංයෝගයක 1 mol සම්පූර්ණයෙන්ම දහනය කිරීමට $O_2$ මවුල 3 ක් ද ඵලය වශයෙන් $CO_2$ මවුල 2 ක් ද $H_2O$ මවුල 2 ක් ද සෑදුණි. X හයිඩ්‍රෝකාබනයේ අණුක සූත්‍රය වනුයේ,

1) $C_2H_6$ 2) $C_2H_4$ 3) $C_3H_8$
4) $CH_4O$ 5) $C_2H_4O$

(7) පහත සඳහන් ජලීය ද්‍රාවණ $25.00 cm^3$ බැගින් මිශ්‍ර කළවිට පිටවන තාප ප්‍රමාණ පහත දී ඇත.

| මිශ්‍ර කළ පරිමාව | පිටවූ තාපය |
|---|---|
| 1) $0.1\, moldm^{-3}$HCl හා $0.1\, moldm^{-3}$NaOH | $\Delta E_1$ |
| 2) $0.1\, moldm^{-3}$ HCl හා $0.1\, moldm^{-3}$ $NH_4OH$ | $\Delta E_2$ |
| 3) $0.1\, moldm^{-3}$ $CH_3COOH$ හා $0.1\, moldm^{-3}$ NaOH | $\Delta E_3$ |
| 4) $0.1\, moldm^{-3}$ HCl හා $0.5\, moldm^{-3}$ NaOH | $\Delta E_4$ |
| 5) $0.1\, moldm^{-3}$ HCl හා $0.5\, moldm^{-3}$ $CH_3COOH$ | $\Delta E_5$ |

ප්‍රතික්‍රියා තාපය ඉහළ ම අගයක් ගන්නේ,

1) $\Delta E_1$ 2) $\Delta E_2$ 3) $\Delta E_3$ 4) $\Delta E_4$ 5) $\Delta E_5$

(8) ද්විතීයික පරිවෘත්තජ වලට අයත් නොවන්නේ,

1) ඇමයිනෝ අම්ල 2) ටර්පිනොයිඩ 3) ෆීනෝල
4) ඇලකලොයිඩ 5) සගන්ධ තෙල්

(9) කරාබු නැටිවලින් සගන්ධ තෙල් නිස්සාරණයේ දී යොදා ගත හැකි වඩාත් සුදුසු ද්‍රාවකය වන්නේ,

1. ජලය 2) තිනර් 3) පැරපින් ඉටි
4) ඩයික්ලොරොමෙතින් 5) ග්ලිසරෝල්

(10) පුනස්ඵටිකීකරණය ආධාරයෙන් සංයෝග සංශුද්ධ කිරීමේ දී සක්‍රිය කාබන් (charcoal) දමා නටවා ගැනීමට හේතුව වන්නේ,

1) අපද්‍රව්‍ය නිසා සංයෝගයට ලබා දෙන ගන්ධය ඉවත් කිරීම.
2) අපද්‍රව්‍ය නිසා සංයෝගයට ලබා දෙන වර්ණය ඉවත් කිරීම.
3) සංයෝගය සංශුද්ධ කිරීමේ දී ලැබෙන ඵල ප්‍රමාණය වැඩිකර ගැනීම.
4) සංයෝගය සංශුද්ධ කිරීමේ දී ලැබෙන ස්ඵටිකවල විශාලත්වය වැඩිකර ගැනීම.
5) සංයෝගය සංශුද්ධ කිරීමේදී ස්ඵටික ලැබෙන වේගය වැඩිකර ගැනීම.

(11) "Like dissolve like" සංකල්පය යනු,

1) ධ්‍රැවීය ද්‍රාවකවල ධ්‍රැවීයතාව වැඩි සංයෝග හොඳින් දියවීම.
2) ධ්‍රැවීය ද්‍රාවකවල ධ්‍රැවීයතාව අඩු සංයෝග හොඳින් දියවීම.
3) ධ්‍රැවීයතාව අඩු ද්‍රාවකවල ධ්‍රැවීයතාව වැඩි සංයෝග හොඳින් දියවීම.
4) ඕනෑම සංයෝගයක් ජලයේ හොඳින් දියවීම.
5) සමහර සංයෝග පමණක් ජලයේ හොඳින් දියවීම

(12) කඩදාසි වර්ණලේඛ ශිල්පය මගින් ශාක පත්‍රවල අඩංගු වර්ණ වෙන් කිරීම සඳහා ශිෂ්‍යයෙකු ලබා ගත් පත්‍ර වර්ණ ලේඛය රූපයේ දක්වේ. $X_1$ සාම්පලයට අදාල $R_f$ අගය වන්නේ,

1) $\frac{b}{a}$ 2) $\frac{b}{c}$
3) $\frac{b}{b+c}$ 4) $\frac{a}{b}$
5) $\frac{b+c}{a}$



(13) පහත ප්‍රතික්‍රියාව සළකා බලන්න.

$$2H_2O_2(aq) \xrightarrow{MnO_2} 2H_2O(\ell) + O_2(g)$$

පහත වරණ වලින් වැරදි වරණය වන්නේ,

1) $MnO_2$ මඟින් ප්‍රතික්‍රියාවේ යාන්ත්‍රණය වෙනස් වේ.
2) $MnO_2$ විෂමජාතීය උත්ප්‍රේරක ලෙස ක්‍රියා කරයි.
3) $MnO_2$ මඟින් ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතාවය වෙනස් වේ.
4) $H_2O_2$ මෙන් $MnO_2$ වැය වේ.
5) $MnO_2$ ප්‍රතික්‍රියාවේ එන්තැල්පිය වෙනස් නොකරයි.

(14) $2AB \rightarrow A_2 + B_2$ යන ප්‍රතික්‍රියාව තනි පියවරකින් සිදුවේ. මෙහි AB අණු ගැටෙන ආකාර කිහිපයක් පහත දැක්වේ. පහත ගැටුම්වලින් ඵලයක් සෑදීමට වඩාත් ඉඩ අඇතිතේ මින් කුමන අවස්ථාවේ ද?

1) 

2) 

3) 

4) 

5) 

(15)

```
      CH2OH
      |
      C = O
      |
  H - C - OH
      |
      CH2OH
```

මෙම අණුව සම්බන්ධ වැරදි වරණය වන්නේ,

1) මෙය කිටෝ ටෙට්‍රෝසයකි
2) ජල විච්ඡේදනයට ලක්වේ.
3) බෙනඩික්ට් පරීක්ෂණයට පිළිතුරු ලබාදේ.
4) මෙය මොනොසැකරයිඩ අණුවකි.
5) මෙය ඔ' හාරක සීනි වර්ගයකි.

(16) වැරදි වරණය තෝරන්න.

1) විටමින් K - රුධිරය කැටි ගැසීමට අවශ්‍ය සංඝටක නිපදවීම.
2) විටමින් D - පොස්පරස් අවශෝෂණයට උපකාරී වේ.
3) විටමින් A - වර්ණක සෑදීම.
4) විටමින් B - සෛල ශ්වසනයේදී වැදගත් වේ.
5) විටමින් E - කොලැජන් තන්තු සංශ්ලේෂණය සඳහා උපකාරී වේ.

(17) ; Bsa k bsmdbk h wdY% my; I reK q , ks a අසත්‍ය ප්‍රකාශය තෝරන්න.

1) තීන්ත වල ගලා යාමේ ගුණයට හේතුව ඒ සඳහා යොදා ගන්නා ද්‍රාවකය වේ.
2) ද්‍රාවකය හා බහු අවයවිකය මඟින් තීන්ත ද්‍රාවණයට අවශ්‍ය දුස්‍රාවී ගුණය ලබා දෙයි.
3) වර්ණක අඩු වූ විට වියළි තීන්ත පටලය දිලිසෙන සුළු බව අඩු රළු පෘෂ්ඨයක් වේ.
4) වඩාත් සුදු වර්ණකයක් ලබා ගැනීමට $(TiO_2)$ වර්ණකය යොදා ගනියි.
5) එනමල් තීන්ත වියළීමේදී වායුගෝලයට කාබනික ද්‍රාවක වාෂ්පය එක්වීම වායුගෝල දූෂණයට හේතු වේ.

(18) ශාක තෙල්වල ඇසිඩ් අංකය (Acid Value) හා එහි ඒකකය වන්නේ,

1) ශාක තෙල් 1g ක අන්තර්ගත මේද අම්ල ප්‍රමාණය උදාසීන කිරීමට අවශ්‍ය KOH ප්‍රමාණය / $mg\,g^{-1}$
2) ශාක තෙල් 1g ක අන්තර්ගත නිදහස් මේද අම්ල ප්‍රමාණය උදාසීන කිරීමට අවශ්‍ය KOH ප්‍රමාණය / $mg\,g^{-1}$
3) නිදහස් මේද අම්ල 1g ක් උදාසීන කිරීමට අවශ්‍ය ශාක තෙල් ප්‍රමාණය / $mg\,dm^{-3}$
4) නිදහස් මේද අම්ල 1g ක් උදාසීන කිරීම අවශ්‍ය වන ශාක තෙල් ප්‍රමාණය / $mg\,g^{-1}$
5) ශාක තෙල් 1g ක අන්තර්ගත නිදහස් මේද අම්ල ප්‍රමාණය උදාසීන කිරීමට අවශ්‍ය මෙතනෝල් ප්‍රමාණය/$mg\,dm^{-3}$

(19) නූතනයේ විදුලි උවාරණ වල තාපස්ථාපන පරිවරණ කොටස් සකසනු ලබන කාබනික සංයෝගය වන්නේ,

1) යූරියා ෆෝමැල්ඩිහයිඩ්
2) මෙලමයින් ෆෝමැල්ඩිහයිඩ්
3) පොලියුරෙතීන්
4) පොලිඅයිසොප්‍රීන්
5) මින් එකක්වත් නොවේ.

(20) ට්‍රාන්ස්එස්ටරීකරණ ප්‍රතික්‍රියාවක් මඟින් ජෛව ඩීසල් නිපදවීමේ අමුද්‍රව්‍ය ලෙස යොදා ගන්නේ,

1) පෙට්‍රෝලියම් අතුරු ඵල හා ට්‍රයිග්ලිසරයිඩ්ය.
2) ග්ලිසරෝල් හා ට්‍රයිග්ලිසරයිඩ් ය
3) ග්ලිසරෝල් හා මෙතනෝල් ය
4) පෙට්‍රෝලියම් අතුරුඵල හා මෙතනෝල් ය.
5) ට්‍රයිග්ලිසරයිඩ් හා මෙතනෝල් ය.

(21)




තල රූපයෙහි වර්ගඵලය වනුයේ, $\left(\sqrt{3}=1.7\right)$

1) $27.75m^2$
2) $29.65\ m^2$
3) $32.50m^2$
4) $35.60m^2$
5) $38.6m^2$

(22)




CD දුර වනුයේ,

1) $\sqrt{350}$ cm
2) $\sqrt{409}$ cm
3) $\sqrt{530}$ cm
4) $\sqrt{603}$ cm
5)

(23)




දිග ගණනය කිරීම සඳහා ළඟා විය නොහැකි විශාල පොකුණක එම දිග ගණනය කිරීම සඳහා සැලසුම් කළ ක්ෂේත්‍ර පොතකින් ගත් උපුටනයක් හා මිනුම් ඉහත රූපයේ දැක්වේ.
ඒ අනුව, පොකුණේ (OA) දිග වන්නේ,

1) 60m
2) 90m
3) 100m
4) 130m
5) 180m

(24) උස ඒකක 2 ක් වන වෘත්තාකාර සෘජු සිලින්ඩරයක් තුළ හරි අර්ධයක් උසට ජලය පිරී ඇත. අරය ඒකක 3 ක් වන ගෝලයක් ඒ තුළට දැමීමෙන් සිලින්ඩරය සම්පූර්ණයෙන් ම ජලයෙන් පිරේ. සිලින්ඩරයේ අරය වනුයේ,

1) ඒකක 04 කි.
2) ඒකක 06 කි.
3) ඒකක 07 කි.
4) ඒකක 09 කි.
5) එකක 10 කි.

(25) $x$ අක්ෂය මත ඡේදන ලක්ෂ්‍ය 4 ක් වූ ද, $y$ අක්ෂය මත ඡේදන ලක්ෂ්‍ය 12 ක් වූ ද සරල රේඛාවේ සමීකරණය වන්නේ,

1) $y = 3x + 4$
2) $y = 3x + 12$
3) $y=\frac{1}{3}x+4$
4) $y = -3x + 12$
5) $y=\frac{1}{3}x-12$

(26) සෘජුකෝණාස්‍රක ශීර්ෂ තුනක් පිළිවෙලින් (4, 1), (7, 4), (13, -2) වේ නම් හතරවන ශීර්ෂයේ ඛණ්ඩාංක වන්නේ,

1) (10, -5)
2) (10, 5)
3) (8, 3)
4) (8, -3)
(5) (-13, 2)

(27) $A \equiv (3, 2)$, $B \equiv (-4, 6)$, $C \equiv (2,2)$ ද BC හි මධ්‍ය ලක්ෂ්‍ය D ද වේ. AD රේඛාවේ අනුක්‍රමණය වන්නේ,

1) $\frac{1}{2}$ 2) $\frac{1}{3}$ 3) $-\frac{1}{3}$

4) $-\frac{1}{2}$ 5) 1

(28) පූර්ණ සංඛ්‍යා හතක කුලකයක සංඛ්‍යා පහත දැක්වෙන අයුරු ආරෝහණ පටිපාටියට සකසා ඇත.

1, 2, 4, x, y, 11, 13

සංඛ්‍යාවල මධ්‍යන්‍ය ලෙස ලැබෙන්නේ $y$ ට හිමි අගයයි. $x$ හා y විය හැක්කේ

1) (6, 7) 2) (6, 8) 3) (5, 6)

4) (7, 9) 5) (8, 10)

(29) සිසුන් 45 සිටින පන්තියක දින 9 දී සිසුන්ගේ පැමිණීම පහත දැක්වේ.

39, 40, 38, 41, 37, 42, 35, 42, 43

දත්ත සමූහයේ පරාසය හා අන්තශ් චතුර්ථක පරාසය පිළිවෙලින්,

1) 8, 5 2) 8, 4.5 3) 8, 2.5

4) 4, 6.5 5) 8, 9

(30) A, B, C, D, E සිසුන්ගේ මධ්‍යන්‍ය බර 325 kg කි. Cගේ බර, ABDE ගේ මධ්‍යන්‍ය බරට සමානය. C ගේ බර,

1) 61 kg 2) 63 kg 3) 64 kg

4) 65 kg 5) 66 kg

(31) එක්තරා සංඛ්‍යා 50 ක සැබෑ මධ්‍යන්‍ය ශූන්‍ය වූ අතර අපගමනවල එකතුව -35 විය.
ගණනයේ දී සිසුවා විසින් ලබාගත් උපකල්පිත මධ්‍යන්‍ය වන්නේ,

1) 0.8 2) 0.6 3) 0.65

4) 0.7 5) 0.75

(32) 12N හා 5N බල යුගලය මගින් 13N ට අඩු සම්ප්‍රයුක්තයක් ලබා ගැනීමට බල දෙක අතර තිබිය හැකි කෝණය විය හැක්කේ,

1) $90^0$ 2) $45^0$ 3) $90^0$ - $180^0$ අතර

4) $60^0$ ට අඩු 5) $30^0$ ට අඩු

(33) m ස්කන්ධයක් සහිත වස්තුවක් සිරස් බිත්තියකට තබා තද කර ඇති ආකාරය පහත රූපයේ දැක්වේ. ගුරුත්වජ ත්වරණය g හා ඝර්ෂණ සංගුණකය $\mu_s$ වේ.




වස්තුවේ සමතුලිතතාව සැළකූ විට, මින් වැරදි ප්‍රකාශය තෝරන්න.

1) $F = R$ 2) $\mu = \mu_s R$

3) $w = mg$ 4) $f_s = \mu_s R$

5) $w = f_s$

(34)

| | මිනුම් උපකරණය | උපකරණයේ අංග |
|---|---|---|
| a) | වර්නියර් කැලිපරය | - බාහිර හනු, අභ්‍යන්තර හනු, දිදාලය |
| b) | මයික්‍රෝ ඉස්කුරුප්පු ආමානය | - කිණිහිරය, ගැඹුර මනින කූර, රෝදය |
| c) | තෙදඬු තුලාව | - තුලා තැටිය, උපදඬු, ස්ර්පණ දර්ශක |

මිනුම් උපකරණය හා එයට අදාල අංග නිවැරදිව දැක්වෙන පිළිතුර වනුයේ,

1) $a$ ය 2) $b$ ය 3) $c$ ය

4) $a$ හා $b$ ය 5) $b$ හා $c$ ය.

(35) සෘජුකෝණාස්‍රාකාර හැඩැති කම්බි රාමුවක් මත බල යුග්මයක් ක්‍රියා කරන ආකාරය රූපයේ දැක්වේ. කම්බි රාමුව සමතුලිතව තබා ගැනීම සඳහා එහි ඉතිරි පාද දෙක මත ක්‍රියා කළ යුතු බල විශාලත්ව හා දිශාවන් නිවැරදිව දැක්වෙනුයේ,




1) CD දෙසට 5N, AB දෙසට 5N
2) DC දෙසට 5N, BA දෙසට 5N
3) CD දෙසට 10N, AB දෙසට 10N
4) DC දෙසට 10N, BA දෙසට 10N
5) DC දෙසට 5N, BA දෙසට 10N

(36) චණ්ඩ මාරුතයක් නිවසට ඉහළින් ඇතිවන අවස්ථාවක් රූපයේ දැක්වේ. එම චණ්ඩ මාරුතය මගින් නිවසේ වහළ මත ඇති කරනු ලබන සඵල බලය,



1) පහළ දිශාවට ක්‍රියාත්මකයි.
2) තිරස් දිශාවට ක්‍රියාත්මක වේ.
3) ශූන්‍ය වේ.
4) ඉහළ දිශාවට ක්‍රියාත්මක වේ.
5) ස්ථිර දිශාවක් කිව නොහැක.

(37) ස්කන්ධය 2kg වන වස්තුවක් සතු ගම්‍යතාවය 2NS වේ. එහි චාලක ශක්තිය,

1) 1 J 2) 2 J 3) 3 J
4) 4 J 5) 5 J

(38) අරය 0.06m වූ තිරස් අක්ෂයක් මත ජව රෝදයක් (fly wheel) සවි කර ඇත. එහි අක්ෂයට ස්පර්ශීය ලෙස 50N ක නියත බලයක් සපයනු ලැබේ. මුළු පද්ධතියේ අවස්ථිති ඝූර්ණය 4 $kgm^2$ වේ. ජව රෝදයේ කෝණික ත්වරණය වනුයේ,

1) 0.35 rad $s^{-2}$ 2) 0.5 rad $s^{-2}$ 3) 0.75 rad $s^{-2}$
4) 1.0 rad $s^{-2}$ 5) 1.5 rad $s^{-2}$

(39) විද්‍යුත් ඒකකයක් සඳහා රු. 5.00 වැය වේ. වොට් 2000 ක විදුලි කේතලයක් යම් ජල ප්‍රමාණයක් නැටවීම (boiling) සඳහා මිනිත්තු 6 ක් ගත වේ.
ජලය නැටවීම සඳහා වැය වන මුදල,

1) රු. 1.00 2) රු. 0.95 3) රු. 1.25
4) රු. 6.00 5) රු. 2.25

(40) ඒකාකාර කම්බියක 5A ධාරාවක් ගලයි. කම්බියේ A නම් ලක්ෂයකදී ගලාගිය ඉලෙක්ට්‍රෝන ප්‍රමාණය වනුයේ, (ඉලෙක්ට්‍රෝනයක ආරෝපනය e ලෙස ගන්න)

1) 5 L 2) $L/5$ 3) $5/L$
4) 360 L 5) $\frac{2}{5}L$

(41) හරස්කඩ වර්ගඵලය සමාන වූද දිග L හා 2L වූද ප්‍රතිරෝධකතා $\rho_1$ හා $\rho_2$ වූ කම්බි 2 ක් ශ්‍රේණිගතව සම්බන්ධ කළ විට සංයුක්ත කම්බියේ සඵල ප්‍රතිරෝධකතාව,

1) $\frac{\rho_1 + \rho_2}{2}$ 2) $\frac{2\rho_1 + \rho_2}{3}$ 3) $\frac{2\rho_1 + \rho_2}{2}$
4) $\frac{\rho_1 + 2\rho_2}{3}$ 5)

(42)




ඉහත රූපයේ දැක්වෙන්නේ ඒකාකාර කුහර ගෝලයකි. එහි ඉහළින් කුඩා සිදුරක් ඇත. O කේන්ද්‍රය රූපයේ දැක්වේ. ඉහත සඳහන් කුහරය හරහා ගෝලයට සම්පූර්ණයෙන් පිරෙන තුරු සෙමින් තෙල් වත් කිරීමේදී එහි ස්කන්ධ කේන්ද්‍රය වෙනස් වන අයුරු නිවැරදිව විස්තර කරන්නේ,

1) එය ක්‍රමයෙන් පහළ බැස යන අතර අවසාන පිහිටීම O ට පහළින් වේ.

2) ක්‍රමයෙන් පහළ බසින අතර ඉන්පසු මුල් පිහිටීම දක්වා ඉහළ යයි.

3) ක්‍රමයෙන් ඉහළ යන අතර එහි අවසාන පිහිටීම, O ට ඉහළින් පිහිටයි.

4) පළමුව එය ක්‍රමයෙන් ඉහළ නගින අතර ඉන්පසු එහි මුල් පිහිටීම දක්වා පහළ බසියි.

5) ගෝලය තෙල් වලින් පිරෙන කාලය තුළ කිසිදු වෙනසක් සිදු නොවේ.

(43) අභ්‍යන්තර කුහරයක් සහිත තඹ කැබැල්ලක් වාතයේදී එහි ස්කන්ධය කිරූ විට 264 g ද ජලයේ දී ස්කන්ධය කිරූ විට 221g ද දක්වයි. තඹ වල ඝනත්වය 8.8 $gcm^{-3}$ ජලයේ ඝනත්වය 1.0 $g\,cm^{-3}$ සලකා කුහරයේ පරිමාව,

1) 12 $cm^3$ 2) 13 $cm^3$ 3) 14 $cm^3$

4) 43 $cm^3$ 5) 30 cm

(44) වස්තුවක උෂ්ණත්වය $1^0c$ කින් ඉහළ නැංවීමට අවශ්‍ය තාපයත්, එම වස්තුවේ උෂ්ණත්වය 1 k කින් ඉහළ නැංවීමට අවශ්‍ය තාපයත්ගේ අනුපාතයේ අගය

1) 27 2) 1 3) $5/9$

4) $100/273$ 5) $1/273$

(45) දුනු කියත පිළිවෙලින් 710 $Nm^{-1}$ හා 2840 $Nm^{-1}$ වන P හා Q දුනු දෙකක් වෙනවෙන ම එකම විශාලත්වයක් ඇති බල 02 ක් මගින් ඇදී පවතී. P හා Q විභව ශක්ති අතර අනුපාතය වන්නේ,

1) 1 : 2 2) 1 : 3 3) 1 : 4

4) 3 : 1 5) 4 : 1

(46) ඒකාකාර ලෝහ තහඩුවකින් ගන්නා ලද ඝන වෘත්තාකාර තැටි 2 කක ඝනකම සමාන වන අතර A තැටියේ විශ්කම්භය B තැටියේ විශ්කම්භය මෙන් දෙගුණයකි. A තැටියේ අවස්ථිති ඝූර්ණය B තැටියේ අවස්ථිති ඝූර්ණය මෙන්,

1) දෙගුණයකි 2) සිව්ගුණයකි 3) අට ගුණයකි

4) 16 ගුණයකි 5) අර්ධයකි.

(47) එක්තරා සේවා ස්ථානයක වාහන එසවීම සඳහා භාවිත කෙරෙන ආරෝහකයක හරස්කඩ අරයන් අතර අනුපාතය 1 : 10 ක් වේ. විශාල හරස්කඩ සහිත පිස්ටනය මත 3000 kg ස්කන්ධයෙන් යුතු වෑන් රථයක් තබා ඇත. එය එසවීමට කුඩා පිස්ටනය මත යෙදිය යුතු අවම බලය වන්නේ,

1) 300 N 2) 450 N 3) 600 N

4) 750 N 5) 900 N

(48) X හා Y ද්‍රව දෙක පිළිවෙලින් $80^0c$ හා $10^0c$ උෂ්ණත්ව වල පවතී. ද්‍රව දෙකෙහි සමාන ස්කන්ධ මිශ්‍ර කල විට මිශ්‍රණයේ උෂ්ණත්වය $30^0c$ විය. X හා Y ද්‍රව දෙකේ වි. තා. ධා අතර අනුපාතය වනුයේ,

1) 1 : 2 2) 2 : 2 3) 2 : 3

4) 2 : 5 5) 3 : 5

(49) පහත දැක්වෙන උපකරණ අතුරින් ආදාන හා ප්‍රතිදාන ද්විත්වයම සහිත උපක්‍රමය වන්නේ,

1) යතුරු පුවරුව
2) ස්පර්ශ සංවේදී තිරය
3) මයික්‍රොෆෝනය
4) තීරු කේත කියවනය
5) නාදකය

(50) පහත සඳහන් කවරක් මෙහෙයුම් පද්ධති (operating system) වන්නේ ද?

A - Dos
B - ෆයර්ෆොක්ස් (Fire fox)
C - මයික්‍රොසොෆ්ට් වින්ඩෝස් (Microsoft Windows)
D - ලිනක්ස් (Linux)

1) A, B හා C පමණි.
2) A, B හා D පමණි.
3) A, C හා D පමණි
4) A, C හා D පමණි.
5) A, B, C, D සියල්ලම

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු
General Certificate of Education (Adv. Level), Grade 13, Second Term Test, March 2020

තාක්ෂණවේදය සඳහා විද්‍යාව - II
Science for Technology - II

67 | S | II

පැය 03 යි
Time: 03 hours

විභාග අංකය : ..........................................

A කොටස - ව්‍යුහගත රචනා
සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.

01. (a) ක්ෂුද්‍රජීවී කර්මාන්තයක නිෂ්පාදිතය වන්නේ පහත දැක්වෙන ඒවායින් එකකි. එවැනි කර්මාන්තයකට උදාහරණයක් පහත දක්වා ඇති වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

| නිෂ්පාදනය | උදා:- කර්මාන්තය |
|---|---|
| (1) ක්ෂුද්‍ර ජීවී සෛල | ........................................................................................ |
| (2) පරිවෘත්තීය අන්තඵල | ........................................................................................ |
| (3) ක්ෂුද්‍ර ජීව ක්‍රියාකාරිත්වය | ........................................................................................ |

(ප්‍රතිජීවක නිෂ්පාදනය, ආහාර ප්‍රතිපූරක, (හතු) බිම්මල් වගාව, කොම්පෝස්ට් නිෂ්පාදනය)

(b) පහත දැක්වෙන කර්මාන්තවල දී ක්ෂුද්‍ර ජීවියාගේ ක්‍රියාව සඳහන් කර එය සිදුකරන ක්ෂුද්‍ර ජීවියාගේ ගණ නාමය සඳහන් කරන්න.

(අ) **බීර/වයින්**

රසායනික ක්‍රියාව: ..............................................................................

ක්ෂුද්‍ර ජීවියාගේ ගණ නාමය: ..............................................................................

(ආ) **එතනෝල් වලින් විනාකිරි**

රසායනික ක්‍රියාව: ..............................................................................

ක්ෂුද්‍ර ජීවියාගේ ගණ නාමය: ..............................................................................

(ඉ) **යෝගට් නිෂ්පාදනය**

රසායනික ක්‍රියාව: ..............................................................................

ක්ෂුද්‍ර ජීවියාගේ ගණ නාමය: ..............................................................................

(c) රසායනික කර්මාන්තයකට සාපේක්ෂව ක්ෂුද්‍ර ජීවී කර්මාන්තයක වාසි 03ක් සඳහන් කරන්න.

(i) ..............................................................................

(ii) ..............................................................................

(iii) ..............................................................................

(d) පහත දැක්වෙන ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂීය රූප සටහන නිරීක්ෂණය කරන්න.




(i) A හා B ලෙස දක්වා ඇති කොටස් නම් කරන්න.

A ............................................................................ B ............................................................................

(ii) A හා B වල කෘත්‍යයන් එක බැගින් සඳහන් කරන්න.

A ............................................................................ B ............................................................................

(e) පරිණත ශාක කඳක කැපූ කොටසක් පහත රූපයේ දැක්වේ.




(i) මෙම රූප සටහනේ සඳහන් A, B, C පිළිවෙලින් නම් කරන්න.

A ............................................................................

B ............................................................................

C ............................................................................

(ii) (a) ද්විතීයික වර්ධනයේ දී ඇතිවන ද්විතීයික සෛලම කාෂ්ඨය හෙවත් දැවය ලෙස හඳුන්වයි.

රූප සටහනේ දැවය ලෙස හඳුන්වා දිය හැක්කේ කවර කොටසක් ද?/කොටස් ද?

..........................................................................................................................................................

(b) මෙම ද්‍රවය හෙවත් කෘෂ්ඨය තුළ වැඩිපුරම අඩංගු වන්නේ දෘඪස්තර පටකයන් ය.

දෘඪස්තර පටකයන්, මෘදුස්තර පටකයෙන් ව්‍යුහාත්මකව වෙනස් වන ලක්ෂණ 2ක් සඳහන් කරන්න.

(i) ..........................................................................................................

(ii) ..........................................................................................................

(iii) ශාක කඳ විවිධ ආර්ථික ප්‍රයෝජන සඳහා යොදා ගනු ලැබේ. රූප සටහනට අනුව

(අ) තාප පරිවාරකයක් ලෙස බහුලව යොදා ගන්නා කොටස කුමක් ද?

..........................................................

(ආ) සුවඳ විලවුන් සඳහා භාවිතා වන ''Agar රෙසිනය'' නිෂ්පාදනය වී තැන්පත් වන කොටස

..........................................................................................................

(f) A හා B රූප සටහන් වලින් පෙන්වා ඇත්තේ මත්ස්‍ය වර්ග 2ක දේහයේ අපර කෙළවර පිහිටි පෞච්ඡ වරල් වල ස්වභාවයන් ය.



A



B

(i) මෙයින් කුමන රූපයක කාටිලේජ මත්ස්‍යයකුගේ පෞච්ඡ වරල්වල ස්වභාවය පෙන්වයි ද?

..........................................................................................

(ii) පහත දෙන ලද මත්ස්‍යයන්ගෙන් අස්ථික මසුන් දෙදෙනකු තෝරා තිත් ඉර මත ලියන්න.

..........................................................................................

[මඩුවා, බලයා, පරවා, මෝරා, තෝරා] ,

(iii) පෞච්ඡ වරලෙන් ඉටුවන කාර්යන් දෙකක් සඳහන් කරන්න.

..........................................................................................................

..........................................................................................................

(iv) අස්ථික හා කාටිලේජ මසුන්ගේ ආර්ථික වැදගත්කම් 2ක් සඳහන් කරන්න.

..........................................................................................................

..........................................................................................................

02. $MX(s)$ හි ජලයේ ද්‍රවනය හා ආශ්‍රිත තාප විපර්යාසය ගණනය කිරීම සඳහා රූප සටහනෙහි දක්වා ඇති ඇටවුම භාවිතා කරන ලදී.




ආස්‍රැත ජලය $100.00cm^3$ක් කෝප්පයට එක් කරන ලදී. ආස්‍රැත ජලයේ ආරම්භක උෂ්ණත්වය $25^0C$ ලෙස මැන ගන්නා ලදී. ඉන්පසු $MX(s)$ 0.1mol ප්‍රමාණයක් ජලයට එකතු කර දිගටම කලතන ලදී. ද්‍රාවනයේ උෂ්ණත්වය ක්‍රමයෙන් අඩුවන බව නිරීක්ෂණය කරන ලදී. මනින ලද අඩුම උෂ්ණත්වය $17^0C$ විය. භාවිතා කල ජල ප්‍රමාණය $MX(s)$ මුළුමනින්ම ද්‍රවනය කිරීමට ප්‍රමාණවත් විය.

ජලයේ ඝනත්වය හා විශිෂ්ට තාප ධාරිතා අගයන් පිළිවෙලින් $1.00gcm^{-3}$ හා $4.20Jg^{-1}.C^{-1}$ වේ.

$MX(s)$ ද්‍රාවනය නිසා ජලයෙහි ඝනත්වය හා විශිෂ්ට තාප ධාරිතා වෙනස් නොවන බව උපකල්පනය කරන්න.

(i) පද්ධතිය (ද්‍රාවනය) නැවත $25^0C$ ට ගෙන ඒම සඳහා සැපයිය යුතු තාපය ගණනය කරන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

(ii) $MX(s)$ හි ජලයේ ද්‍රවනය තාපවශෝෂක හෝ තාපදායක ක්‍රියාවලියක් වේද? හේතු දක්වන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

(iii) $MX(s) + H_2O(l) \rightarrow M^+(aq) + X^-(aq)$ ප්‍රතික්‍රියාව ආශ්‍රිත ප්‍රතික්‍රියා තාපය ($kJmol^{-1}$) වලින් ගණනය කරන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

(iv) මෙම පරීක්ෂණය ජලය $200cm^3$ භාවිතයෙන් සිදු කළේ නම් උෂ්ණත්ව වෙනස ඉහත අගයට වඩා වැඩිවේ යැයි ඔබ බලාපොරොත්තු වන්නේද? ..........................................................................................

ඔබගේ පිළිතුර පහදන්න. ..........................................................................................

(v) පද්ධතියෙහි (ද්‍රාවනයෙහි) උෂ්ණත්වය වෙනස් වන අයුරු උෂ්ණත්ව - කාලය වක්‍රය ඇඳීමෙන් පෙන්වන්න.

(සැ. යු. අවසානයේ දී පද්ධතිය කාමර උෂ්ණත්වය ($25^0C$) කරා ළඟා වේ.




(vi) මෙම පරීක්ෂණයේ දී ලෝහ කෝප්පයක් වෙනුවට ප්ලාස්ටික් කෝප්පයක් භාවිතා කරන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

(vii) උෂ්ණත්වය වැඩිවීමත් සමඟ MX(s) හි ද්‍රාව්‍යතාව වැඩි හෝ අඩුවේ යැයි ඔබ බලාපොරොත්තු වන්නේ ද?

..........................................................................................................................................

ඔබගේ පිළිතුරු සඳහා හේතු දක්වන්න.

03. ග්ලූකෝස් අණු බහු අවයවීකරණය වෙමින් නිර්මාණය වන ශාක සංචිත කෘත්‍යය ඉටු කරනු ලබන කාබොහයිඩ්‍රේටයක පවතින අණු වර්ග දෙකක ව්‍යුහාත්මක ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

(a)

| කාබොහයිඩ්‍රේටය | ව්‍යුහාත්මක ලක්ෂණ |
|---|---|
| X | ප්‍රධාන දාමයේ $\alpha(1 \rightarrow 4)$ බන්ධන දක්නට ලැබෙන රේඛීය දාම බහු අවයවිකයකි. ශාඛනය වී නැත. |
| Y | ප්‍රධාන දාමයේ $\alpha(1 \rightarrow 4)$ බන්ධන දක්නට ලැබේ. ශාඛනය වූ දාමය $\alpha(1 \rightarrow 6)$ බන්ධන දක්නට ලැබේ. |

(i) මෙහි X හා Y හඳුනාගන්න.

X: ..........................................................................

Y: ..........................................................................

(ii) X හෝ Y සංයෝග විද්‍යාගාරයේ පරීක්ෂණාත්මකව හඳුනා ගැනීමට යොදා ගත හැකි ප්‍රතිකාරකය සඳහන් කරන්න. ..........................................................................................................

(b) (i) සත්ත්ව පටකවල සංචිත කෘත්‍යය ඉටු කරන කාබෝහයිඩ්‍රේටය කුමක් ද? ..................................................

(ii) එම කාබෝහයිඩ්‍රේටය සංචිත විය හැකි සත්ත්ව පටකයක් නම් කරන්න. ...................................................

(c) මිනිස් සත්ත්ව පටකවල ග්ලූකෝස් ශ්වසනය කිරීම මගින් ශක්තිය මුදා හරිනු ලබනු ලැබේ. ඒ සම්බන්ධ තාප රසායනික සමීකරණය පහත දැක්වේ.

$C_6H_{12}O_6 + 6O_2 \rightarrow 6CO_2 + 6\ H_2\ O +$ තාපය 2800kj $mol^{-1}$

(අ) මෙය කවර ශ්වසන විලාසයක් පෙන්නුම් කරයි ද? ...............................................................

(ආ) මෙම පරිවෘත්තීය ක්‍රියාවලිය කවර ඉන්ද්‍රිකාවක් තුළ සිදුවේ ද? .......................................................

(ඇ) ග්ලූකෝස් 450g දහනය මඟින් කොපමණ තාප ශක්තියක් උත්පාදනය විය හැකිද?

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

(C = 12, H = 1, O = 16)

(d) ශිෂ්‍යයෙක් රාත්‍රී ආහාරයට කිලෝ කැලරි 2000 ශක්තියට සමාන ආහාර ප්‍රමාණයක් ගනී. මෙම ශක්ති ප්‍රමාණයෙන් අධික ශක්තියක් ශරීරයෙන් වැය කිරීම සඳහා ඔහු විසින් රාත්‍රී ආහාරයට පසු ක්‍රීඩාගාරයට (Gym) ගොස් 50kg ක භාරයක් වාර ගණනක් ඔසවනු ලැබේ. (කැලරි 1 = ජූල් 4.2)

(i) රාත්‍රී ආහාරයට ලබාගත් කිලෝ කැලරි ප්‍රමාණය ජූල්වලින් ගණනය කරන්න. ...........................................

..........................................................................................................................

(ii) ඔහු එක් වාරයකදී ස්කන්ධය 2m ඉහළට ඔසවනු ලබන බවත් එය බිම හෙළන විට ශක්තිය වැය නොවන බවත් උපකල්පනය කරමින්

ඔහු එක් වාරයකදී එසවීමේදී කරන ලද කාර්යය ගණනය කරන්න. (ගුරුත්වජ ත්වරණය $10ms^{-2}$ ලෙස ගන්න.)

..........................................................................................................................

(iii) මෙම කාර්යය සඳහා ඔහු විසින් 50kgක ස්කන්ධය කිනම් වාරයක් එසවිය යුතු දැයි ගණනය කරන්න.

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

(iv) ලැබුණු වාර ගණන හා සසඳන විට ශරීරයේ යෝග්‍යතාව ආරක්ෂා කර ගැනීම සඳහා ගත යුතු යැයි හැඟෙන වඩාත් උචිත පූර්වෝපාය මාර්ගය කුමක් විය යුතු දැයි ඔබට නිගමනය කළ හැකිද?

..........................................................................................................................

(e) හෙපටයිටිස් B වෛරසය මගින් අක්මාවේ විවිධ අසාමාන්‍යතා ඇති කරයි. ඒවා අතර සිරෝසිස් (Cirrohosis) ප්‍රාථමික අක්මා පිළිකා (Primary liver Cancer) වැනි තත්ත්ව ඇති විය හැක. මෙම වෛරසයේ ප්‍රවේණික ද්‍රව්‍ය ද්විදාම චක්‍රීය DNA අණුවකි.

(i) වෛරස් වල අඩංගු වන වෙනත් ප්‍රවේණික ද්‍රව්‍යයක් සඳහන් කරන්න...................................................

(ii) වෛරස් සතු ජීවී හා අජීවී ලක්ෂණයක් බැගින් සඳහන් කරන්න.

ජීවී ලක්ෂණ ............................................................................................................

අජීවී ලක්ෂණ ............................................................................................................

(f) 80kg ක ස්කන්ධයක් ඇති මිනිසෙකුට වෛරස් අසාත්මික වීමෙන් ඇති වූ රෝගී අවස්ථාවකදී ශරීරයේ උෂ්ණත්වය $2^0C$ කින් ඉහළ ගිය බව පෙන්නුම් කරන ලදී.

(i) ශරීරයේ උෂ්ණත්වය $2^0c$ කින් ඉහළ නැංවීමට සෛල තුළ සිදුවන රසායනික ප්‍රතික්‍රියා වලදී කොපමණ ශක්ති ප්‍රමාණයක් නිපදවිය යුතුදැයි ගණනය කරන්න. (ශරීරය බොහෝ දුරට ජලයෙන් සමන්විත බව උපකල්පනය කරන්න.)

..........................................................................................................................................

..........................................................................................................................................

(ජලයේ විශිෂ්ට තාප ධාරිතාව 4200J $kg^{-1}k^{-1}$)

(ආ) උණ තත්ත්වයට බාහිරින් කෙටි කාලීන සහනයක් ලබාදීම සඳහා නලල මත $0^0c$ පවතින ජලය සහිත කුඩා රෙදි කඩක් එලන ලද නම්, මෙම රෙදි කඩෙහි ජලය $25ml$ පමණ පවතී යැයි ද by; uḷqaj k ; dnf hk a0'72 $\times 10^2$ නලලෙන් පිටවේ යැයි ද උපකල්පනය කරමින් රෙදි කඩ මත පවතින ජලයේ උෂ්ණත්වය කොපමණකින් ඉහළ යා හැකි දැයි (ආසන්නව) ගණනය කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

04.




PQRS කම්බි රාමුවක් රූපයේ පරිදි QR බාහුව තිරස්ව පිහිටන ලෙස **පරිවාරක තන්තු** මඟින් දුනු තරාදියක එල්ලා ඇත. කම්බි රාමුව තුළින් ධාරාව යාමට හැකි වනසේ රසදිය භාජන දෙකක P හා S දෙකෙලවර ගිල්වා ඇත. CD කම්බි කොටස QR ට **ඈතින්** පිහිටා ඇත.

(a) (i) කම්බි රාමුවේ තලයට ලම්බක වන පරිදි ස්‍රාව ඝනත්වය B වූ ඒකාකාර චුම්බක ක්ෂේත්‍රයක් ඇති විට QR තුළින් ගලන ධාරාව I ද එහි දිග L ද ලෙස ගනිමින් QR කොටස මත ඇති වන බලයේ විශාලත්වය දැක්වීමට සමීකරණයක් ලියන්න. ..........................................................................................

(ii) එම බලයේ දිශාව සොයා ගැනීමට උපකාරී වන නීතිය සඳහන් කරන්න.

..........................................................................................................................................

(iii) චුම්බක ක්ෂේත්‍රය, කඩදාසියේ තලයට ලම්බකව තලයෙන් ඉවතට ක්‍රියා කරයි නම් QR දෙසට ධාරාව ගලා යන විට QR මත ඇති වන බලයේ දිශාව කුමක් ද?

.................................................................................................

(b) (i) K යතුර වැසූ විට දුනු තරාදියේ පාඨාංකය අඩුවේ ද? වැඩිවේ ද? ..........................................

ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.............................................................................................

.................................................................................................................................................

(ii) භාජනවල ද්‍රාවන ලෙස රසදිය යොදා ඇත. මෙම ක්‍රියාකාරකම සඳහා වැදගත්වන රසදියවල භෞතික ගුණය සඳහන් කරන්න. ..........................................................................................................

(c) (i) ධාරාව ගලා යන විට දුනු තරාදියේ පාඨාංකයේ වෙනස Q නම් Q, L, I හා B අතර සම්බන්ධය දැක්වෙන ප්‍රකාශනයක් ලියන්න.

.................................................................................................................................................

(ii) Q = 25g L = 30cm B = 0.4T නම් QR තුළින් ගලන ධාරාව ගණනය කරන්න.

